# 15

# අවසර ලබාගැනීම

අන් අයට අයත් ගෙවල් කාර්යාල සහ කර්මාන්තශාලා වැනි ස්ථානවලට අප යා යුතු නම් පළමු ව ඒ අයගෙන් අවසර ලබා ගත යුතු ය. ඒ සඳහා සමහර ස්ථානවල දොර ළඟ සීනුවක් සවි කර තිබිය හැක. සෑම කෙනා ම තමනට අයත් ස්ථානවල නිදහසේ සිටිති. අන් අයට එම ස්ථානයට යාමට අවශ්‍ය නම් ඒ සඳහා අවසර ලබා ගැනීම අවශ්‍යය. එසේ අවසර ලැබෙන්නේ නම් එහි යාමට බාධාවක් නැත. එසේ නොමැති ව අවසරය ප්‍රතික්ෂේප කෙරේ නම් එහි නො යා ආපසු හැරීම වඩාත් සුදුසු ය. අවසර ලබාගන්නේ කෙසේ දැයි ඉස්ලාම් අපට උගන්වා ඇත. එය දැන අනුගමනය කර ජීවත්වීම අවශ්‍යය.

පහත සඳහන් අල්කුර්ආන් වැකිය අන් අයගේ නිවෙස්වලට ඇතුළු වීමේ දී අවසර ලබාගැනීමේ අවශ්‍යතාව අවධාරණය කරයි.

"අල්ලාහ්ගේ විශ්වාසවන්තයෙනි, ඔබගේ නොවන ගෙවලට ඔබ (ඇතුළුවීමට අදහස් කළේ නම්) එහි ඇති අයට සලාම් කියා (ඔවුන්ගේ) අවසරය නො ලබා එහි ඇතුළු නොවන්න." (24:27)

### අවසර ලබා ගැනීමේ ක්‍රියා පිළිවෙළ

#### 1. අන් අයගේ නිවෙස්වලට අතුළු වීමට කලින් සලාම් පැවසිය යුතුයි.

දිනක් සහාබිවරයෙක් නබි (සල්) තුමාගේ නිවසට ඇතුළු වීම සඳහා " ඇතුළු විය හැකි දැයි අවසර ඉල්ලීහ. වහාම නබි (සල්) තුමාණෝ තම සේවකයාට "ඔබ ගොස් අවසර පතන ආකාරය ඔහුට උගන්වන්න" යැයි කීවෝ ය. ඔහු "අස්සලාමු අලයික්කුම් ඇතුළට ඒමට අවසර දැයි අසනු මැනවි" යි කියා දුන්නේය. (අබූ දාවූද්)

## 2. අවසර පතන්නේ තුන් වරකි.

අවසර පතන්නේ තුන් වරක් පමණි. අවසරය ලැබුණි නම් ඇතුළු වන්න නැතහොත් ආපසු හැරෙන්න. (බුහාරි මුස්ලිම්)

පළමුව සලාම් පැවසිය යුතුයි. එයට පිළිතුරක් නැති විට දොරකඩ සීනුව නාද කළ යුතු ය. ඉන් පසු ඔවුන් දොරකඩට පැමිණයේ නම් සලාම් කියා අවසර පැතිය යුතුයි. සීනුව නාද කිරීම හෝ දොරට තට්ටු කළ යුත්තේ තෙවරක් පමණි. අවසරය නොලැබුණි නම් ඇතුළු විය නො හැකි ය.

අන්‍යයන්ගේ නිවෙස්වල හෝ කාර්යාලවල

- ★ කිසිවෙකු නො සිටියේ නම් හෝ
- ★ අවසරය නො ලැබුණි නම් හෝ
- ★ ආපසු හැරෙන්නැ යි පවසනු ලැබූ විට හෝ ආපසු හැරිය යුතු ය.



### 3. නිවෙස ඇතුළට එබී බැලීමෙන් වැළකීම.

"අවසර පැතීම මාර්ගයක් කරනු ලැබුවේ වැරදි බැල්මෙන් ආරක්ෂා වීම සඳහා ය. එම නිසා අනුන්ගේ නිවසකට යන අයකු අවසර පැතීමෙන් පමණක් නැවතිය යුතුය. තම බැල්ම එම නිවස තුළට නො යැවිය යුතු ය." (බුහාරි, මුස්ලිම්)

අනුනට අයත් ස්ථාන දෙස දොර තුළින් හෝ ජනේලය තුළින් හෝ එබී බැලීම වැරදි ක්‍රියාවකි. තම නිවසේ ම ඇති අන් අයගේ කාමරවලට යන අවස්ථාවල ද ඔවුන්ගේ අවසරය පැතිය යුතු ය.

ඔබගේ දරුවන් වැඩිවියට පත් වන අවස්ථාවල ඔවුන් ද තමන්ගේ වැඩිහිටියන් අවසර පතන ආකාරයෙන් අවසර පැතිය යුතු ය. (24:59)

අයෙකු තම දරුවන්, මව, සහෝදරයන්, සහෝදරියන්, පියා වැනි අයකුගේ නිවෙස්වලට ඇතුළු වීමට අවශ්‍ය වන අවස්ථාවල ද අවසර ලබා ගත යුතුය.

අපගේ නිවෙස් තුළට ඇතුළු වන විට ද සලාම් කිව යුතු ය යන්නට පහත සඳහ න් අල්කුර්ආන් වාක්‍යය සාධකයක් වන්නේ ය.

හසරත් අනස් (රලි) දෙස බලා, නබි (සල්) තුමාණෝ මෙසේ වදාළහ.

"පුතුනි, ඔබගේ පවුලේ අය වෙත ඔබ ගියේ නම්, ඔබ සලාම් කියන්න. එය ඔබටත් ඔබගේ නිවසේ අයටත් (බරකතයක්) සංවර්ධනයක් වනු ඇත." (තිර්මිදි)

සභාවලට යන විටත්, එහි සිට සමුගෙන යන විටත්, අවසර ලබාගන්නා ආකාරයෙන් සලාම් පැවසිය යුතු ය.

"ඔබගෙන් අයෙක් සභාවට පැමිණෙන්නේ නම් ඔහු සලාම් පැවසුවාවේ. එහි සිට පිටත් වීමට කැමැති වන විට ද සලාම් පැවසුවාවේ." (අබූදාවූද්)

"අප අන් අයගේ නිවෙස් කාර්යාලවලට තනිව හෝ පවුල් පිටින් හෝ ගිය විට ද මුලින් ම ඔවුනට සලාම් පැවසිය යුතුයි. පසුව ඇතුළට පැමිණිය හැකි දැයි අවසරය පැතිය යුතුයි. අවසර නොලැබුණි නම් ආපසු යා යුතු ය. මේ මගින් නෑකම් තිසි පරිදි සකස් කෙරේ. තම නිවසට යන විටත් සභාවලට යන විටත්, සමු ගන්නා විටත් සලාම් කිව යුතුයි. මෙමගින් සෑම නිවසකම (බරකත්) සෞභාග්‍යය ඇති වන්නේ ය. මෙය අලංකාර නබි මග වන්නේ ය. මෙය සෑම විට ම අනුගමනය කර ජීවත් වෙමු.

අභ්‍යාසය

පහත ප්‍රකාශ හරි නම් හරි යැයි ද වැරදි නම් වැරදි යැයි ද ලකුණු කරන්න

1. අන් අයගේ ස්ථානවලට යෑමට අවසර ලබාගත යුතු ය ( )

2. දොරකඩ සීනුව නාද කිරීමෙන් ද අවසර පැතිය හැකි ය ( )

3. දොරකඩ සීනුව සවිකර නැති නිවෙස්වල දී සලාම් කිව යුතු ය ( )

4. අවසර පැතිය යුත්තේ තුන් වතාවක් පමණි ( )

5. සභාවකට යන විට සලාම් කිව යුතුයි ( )

6. අන් කිසිවෙකුගේ නිවසක ජනේලය තුළින් බැලිය හැකි ය ( )

7. අපේ ම නිවසට ද සලාම් කියමින් ඇතුළු විය යුතුය ( )

8. අනුන්ගේ නිවෙස්වලට ඇතුළු වන විට ද අවසර පතන ලෙස අල්කුර්ආනයේ පවසයි ( )

9. දෙමව්පියන්ගේ කාමර තුළට අවසර නැතිව ඇතුළු විය හැකි ය ( )

10. ඉස්ලාමයේ අවසර පතන ක්‍රමය පෙන්වා නැති නිසා අප කැමති අයුරින් අවසර පැතිය හැකිය. ( )